# ඩෙල්ෆ් දූපතේ තනි වුනු අශ්වයෝ

ඩෙල්ෆ් දූපතක්. මෙහි මිනිස්සු 4000 ක් 5000 ක් විතර ඉන්නවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඩෙල්ෆ්.

ඩෙල්ෆ් දූපතේ අශ්වයන් ඉන්නවා. ඔවුන් ඕලන්ද යුගයේ බඩු අදින්න ගෙනාපු අශ්වයින්. දැන් ඔවුන් අපේ රටට අනුවර්තනය වෙලා. මධ්‍යම ප්‍රමාණයේ අශ්වයින් 400 ක් 500 ක් විතර ඉන්නවා.

මේ අශ්ව ගහණය සොබාවිකවයි පාලනය වෙන්නේ. ඩෙල්ෆ් ප්‍රදේශයට ජුනි සිට සැප්තැම්බර් දක්වා ඇති නියඟයක් එනවා. මේ නියගයත් එක්ක වයෝවෘද්ධ සතුන් හා පැටවුන් මිය යනවා. ශක්තිමත් අය ජීවත් වෙනවා. වන උද්‍යානයේ සාදා ඇති ටැංකි වලට වනජීවී දෙපාර්තමේන්තුව බවුසර් මඟින් වතුර ලබා දෙනවා. නමුත් මේ කාලය තුළ සතුන් මිය යනවා.

කල්පිටියේ ඉඳලා යාපනයට එනකම් නොගැඹුරු මුහුද තියෙන්නේ. මේ මුහුදේ මුහුදු ඌරන් ඉන්නවා. උන් ආහාරයට ගන්නේ මුහුදු තණ. මුහුදු තණ යාපනයේ ඉඳලා පහලටම හැදිලා තියෙනවා. එක විශේෂයක් ආවේණිකයි ධීවර කටයුතු නිසා නොගැඹුරු මුහුදේ ඉන්න මුහුදු ඌරන් තර්ජනයට ලක් වෙලා තියෙනවා.

මේ ඩෙල්ෆ් දූපතේ ‘බයෝප්ැක්’ කියන විශේෂ වෘක්ෂයක් තියෙනවා. මෙය දකුණු අප්‍රිකාවෙන් ගෙනාපු ගසක්. තලෙයි මන්නාරමෙත් මේ වගේ ගසක් තියෙනවා. ලංකාවට තියෙන්නේ මේ ගස් දෙක විතරයි.

සංචාරකයන් දූපතට එනවා. ඔවුන්ට යන්න එන්න පෞද්ගලික බෝට්ටු තියෙනවා. වනජීවී දෙපාර්තමේන්තුවට අයත් බෝට්ටුවෙන් කාර්ය මණ්ඩලය යනවා එනවා. මීට අමතරව උදේ 8.00 ට විතර මාර්ග සංවර්ධන අධිකාරියෙන් 100 කට විතර යන්න පුළුවන් බෝට්ටුවක් දූපතට එනවා. ඒ බෝට්ටුවේ නොමිලේ යන්න එන්න පුලුවන්. නාවික හමුදාවෙන් බෝට්ටුවේ මෙහෙයුම් කටයුතු කරන්නේ.

ඩෙල්ෆ් දූපතටත් සංක්‍රමණික පක්ෂීන් එනවා. ඩෙල්ෆ් දූපත සම්බන්ධ විශේෂ සිද්ධියක් නොවුවත් යුද්ධයෙන් පස්සේ මේ පරිසරය සාමාන්‍ය තත්වයට හැරෙන විට එහි කොටස් කාරයකු වී ඉන්න ලැබීම සතුටක්.

## ජී. යූ. සාරංග මහතා



ජී. යූ. සාරංග මහතා 1983 වනජීවී දෙපාර්තමේන්තුවට බැඳුණේ අඩවි ආරක්ෂක නිලධාරියෙකු ලෙසය. විවිධ ජාතික උද්‍යාන හා අභය භූමි වල සේවය කිරීමට සාරංග මහතා භාග්‍යවන්ත විය. ඔහුට මූලික පුහුණුව ලැබුණේ යාල හා විල්පත්තු අභය භූමි වලිනි. සීගිරිය අභය භූමිය භාරව වැඩ කළ ඔහු පසුව මින්නේරිය ජාතික උද්‍යානයේත් අනතුරුව අවුරුදු 7ක් වස්ගමුව ජාතික උද්‍යානයේත් සේවය කළේය. එමෙන්ම 2004- 2005 වර්ෂවල හා 2009- 2012 වර්ෂයන්හිදී ඔහු හෝර්ටන් තැන්න ජාතික උද්‍යානයේ උද්‍යාන භාරකරු ලෙස සේවය කළේය. අනතුරුව සහකාර අධ්‍යක්ෂක වරයකු ලෙස උසස්වීම් ලැබූ සාරංග මහතා කිලිනොච්චි ප්‍රදේශය භාරව ද පසුව අම්පාර ප්‍රදේශය භාරව ද කටයුතු කළේය.


මේ වනවිට ඔහු වවුනියා කලාපය භාරව සේවය කරයි.

1995 වසරේ දී වනජීවී දෙපාර්තමේන්තුව මඟින් ප්‍රදානය කරනු ලබන මාස 9 ක ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ සාරංග මහතා එහි කොටසක් ලෙස මාස 3ක් ඉන්දියාවේ ඩෙහෙරාඩූන් නගරයේ වනජීවී ආයතනයේ පුහුණුව ලැබීය. ඔහු කොරියාව, පිලිපීනය, තායිලන්තය වැනි රටවල ද කෙටි පුහුණු පාඨමාලා හදාරා ඇත.

සාරංග මහතාගේ නිවස පිහිටා ඇත්තේ මහනුවර, කටුගස්තොටය.

# ඩෙල්ෆ් ජාතික උද්‍යානය

ඩෙල්ෆ් දූපත ශ්‍රී ලංකාවේ ජනාවාස වූ දූපත් වලින් දුරස්ව ලංකාවේ වයඹ දෙසින් සහ ඉන්දියන් සාගරයේ දකුණු දෙසට වන්නට පිහිටා ඇත. යාපන අර්ධද්වීපයේ ස්වභාව සෞන්දර්යෙන් මෙන්ම පැරණි ගොඩනැගිලිවල නටඹුන් වලින් හැඩවුනු ඩෙල්ෆ්ට් දූපත කාගෙත් සිත් ඇදබැද ගත් දිර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ දූපතකි.




**ඩෙල්ෆ් ජාතික උද්‍යානයේ සිතියමක්**

මෙම දූපත ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ යාපනය පරිපාලන දිස්ත්‍රිකයට අයත්ය. නෙඩුන්තිව් (ඩෙල්ෆ්) දූපතේ පිහිටා ඇති හෙක්ටයාර 1846.2 කින් සමන්විත වන්නාවූ භූමි ප්‍රදේශය, සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ ප්‍රතිපාදනයන්ට අනුව 2015 ජූනි 22 අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

ඕවලාකාර හැඩයකින් සමන්විත වන දූපතේ වර්ගඵලය වර්ග කිලෝ මීටර් 50 ක් වන අතර උපරිම දිග කිලෝමීටර් 8ක් සහ පළල කිලෝමීටර 6 ක් වේ. යාපනයට කිලෝමීටර් 35ක් නිරිත දෙසින් පිහිටා ඇති භූමියකි. ලංකාවේ යාපනය අර්ධද්වීපයේ බටහිර කෙළවරේ ඉන්දියානු ගොඩබිමට කිලෝමීටර් 80ක් දුරින් ද තලෙයිමන්නාරම සහ රාමේශ්වරම් වලට කිලෝමීටර් 42ක් දුරින්ද පෝක් සමුද්‍ර සන්ධිය මැද පිහිටා තිබෙන ඩෙල්ෆ් දූපත, ශ්‍රී ලංකාවට අයත් දෙවන විශාලතම දූපත වේ.

ඩෙල්ෆ් දූපත පුරාම ඇත්තේ පෘතුගීසි සහ ලන්දේසි යුගවලට අයත් යටත් විජිත රාජ්‍යයන්හි වගතුග කියාපාන නටඹුන් සහ ඊටත් එහා යුගයන් දක්වා දිවයන බොදු නටඹුන්ය. දූපතේ ඉතිහාසය මීට වසර 1000කට පමණ පෙර චෝළ රාජවංශය කාලය දක්වා දිවෙන අතර, දිවයිනේ බටහිර වෙරළ තීරයේ පැරණි ස්තූපද දැකිය හැක. ලන්දේසි යුගයේ දී මෙම දූපත ශක්තිමත් වූ අතර පෘතුගීසි විසින් භාවිතා කරන ලද පසුව ලන්දේසීන් විසින් භාවිතා කරන ලද “මීකානම්” වූ එකම යටත්විජිත බලකොටුවද මෙහි පිහිටා ඇත. තවද ඩෙල්ෆ් දූපතෙහි දකුණු වෙරළ තීරයෙහි ලන්දේසීන් විසින් ඉදිකරන ලද සරල ප්‍රදීපාගාරයක් බඳු වූ ක්වීන්ස් කුළුණ හෙවත් රැජින කුළුණ ද වේ.



මීකානම් බලකොටුව



පෞරාණික ස්ථූප නටඹුන්



පෞරාණික ස්ථූප නටඹුන්



ක්වීන්ස් කුළුණ

මෙම උද්‍යානයේ විශේෂත්වය වන්නේ ලංකාවේ අනෙකුත් උද්‍යානවල දක්නට නොමැති ඩෙල්ෆ් වලට ආවේණික වූ කැලෑ අශ්වයින් දක්නට ලැබීමයි. උද්‍යානයේ හමුවන කැළෑ අශ්වයින් 16 වන සියවසේදී පෘතුගීසින් විසින් අරාබියෙන් ගෙනවිත් ඇති අතර පසුව ලන්දේසීන් විසින් අභිජනනය කොට ඩෙල්ෆ්ට් හරහා වැටී ඇති මුහුදු මාර්ගය ඔස්සේ ගමන් ගන්නා නෞකාවලට අලෙවි කර ඇත. ලන්දේසීන් මෙරට හැරගිය පසු මෙම අශ්වයින් ක්‍රමයෙන් වල් වැදී කැළෑ අශ්වයින් බවට පත්වී ඇත. ඩෙල්ෆ්ට්හි සිටින මෙම අශ්වයින් බොහෝ විට හැඳින්වන්නේ "පෝනීන්" ලෙසය.

නොගැඹුරු මුහුදු ආශ්‍රිත කලාපයක් වන මෙහි වැසි සමය ඔක්තෝම්බර් සිට පෙබරවාරි දක්වා වන නමුත් මුළු වර්ෂා කාලය තුලම නිල් අහසක් ඇති දින ගණනාවක්ද තිබේ. වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 750ක් පමණ වන අතර සාමාන්‍යයෙන් උතුරු අර්ධ ගෝලයේ ගිම්හාන මාසවල වියළි කාලයේ උච්චතම කාලයේදි වර්ෂාපතනය මුළුමනින්ම හිඟ වේ. වාර්ෂික වර්ෂාපතනය ඉතා අඩු අගයක පවතින බැවින් මෙහි අර්ධ ශුෂ්ක කලාපීය ලක්ෂණ පෙන්වයි. දූපත මධ්‍යයෙහි වෙඩිඩුක් කුලම් සහ පෙරිය කුලම් ලෙස වැව් දෙකක්ද පිහිටා ඇත.

වියළි දේශගුණික තත්වයන්ට හා ප්‍රදේශයේ පවතින පසට (Porous coralline soil) හැඩගැසුණු ශාක උද්‍යානය තුළ දැකගත හැකිය. මුල් යුගයේ පදිංචි වූවන් එය මුළුමනින් එළිකොට ඇති බැව් පෙනෙන අතර, කටුක කාලගුණ තත්වයන් හා ශාක භක්ෂක සතුන්ගේ තණ උලා කෑම නිසා මෙහි දේශීය ශාක වර්ධනය ඇනහිට ඇති බැව් පෙනේ. හඳුනා ගත් විශේෂ අතර සපුෂ්ප ශාක විශේෂ 209 ක්, පඳුරු විශේෂ 29ක්, අපුෂ්ප ශාක විශේෂ 67 ක් සහ ඖෂධ පැළෑටි විශේෂ 70 ක් පමණ වේ. තල් ශාකය බහුල ලෙස දූපත පුරා පැතිර තිබෙනු දක්නට හැකිය. උද්‍යානයේ පිහිටා ඇති බයෝබැබ් ශාකය නිවර්තන අප්‍රිකාවේ ඉතියෝපියාව නිජබිම කරගත් ශාක විශේෂයකි. මෙම ශාකය අරාබි වෙළඳුන් විසින් මෙහි රෝපණය කර ඇතැයි විශ්වාස කෙරේ. මෙම ශාකයේ කඳෙහි විශාල කුහරයක් ඇති අතර එහි මිනිසුන්

කිහිප දෙනෙකුට පහසුවෙන් සිටගෙන සිටිය හැකි තරම් විශාල ය. මෙහි කඳේ උස මීටර් 12ක් පමණ වන අතර වට ප්‍රමාණය මීටර් 15ක් පමණ වේ.





**බයෝබැබ් ශාකය**



**තල් ශාකය**

වාර්තා වී ඇති මල් විශේෂ අතර වඳවීමේ තර්ජනයට ලගාවෙමින් පවත්නා *Fimbristylis dipsacea* විශේෂයද වඳවීමේ තර්ජනයට ලක්ව ඇති *lpomoea coptica, Cocculus hirsutus* හා *Peplidium maritimum* විශේෂ 5ක් මෙන්ම තර්ජනයට ලක්වීමට ආසන්න විශේෂ 11 ක්ද හමුවේ. මුහුදු ශාක අතර *Sargassum* සහ *Caulerpa* ඇල්ගී විශේෂ බහුලව දැකිය හැක.

උද්‍යානයේ සත්ව විශේෂ අතරින් ක්ෂීරපායි විශේෂ 11ක්, උභයජීවි එක් විශේෂයක්, උරග විශේෂ 08ක්, පක්ෂි විශේෂ 101ක්, සමනල් විශේෂ 15ක් සහ කූරන් විශේෂ 10ක් වාර්තා වේ.

ඩෙල්ෆ් ජාතික උද්‍යානය තුළ ක්ෂිරපායින් අතරින් ඩෙල්ෆ් පෝනි හෝ කැලෑ අශ්වයා ප්‍රමුඛ වේ. මොවුන් 1000කට ආසන්න ප්‍රමාණයක් උද්‍යානය තුළ වාසය කරයි. එසේම කුඩා ක්ෂීරපායි අතර බොර මුගටියා, අලු මුගටියා, වල් හාවා, මා වවුලා හෝ පළතුරු වවුලා සුලභ විශේෂ වේ.




**කැලෑ අශ්වයා**



**වල් හාවා**



**මා වවුලා**

උරග විශේෂ ලෙස වැලි පොළඟා, ගරා කටුස්සා දැකිය හැක.



**වැලි පොළඟා**



**ගරා කටුස්සා**

උද්‍යානය වැඩි පක්ෂි විවිධත්වයක් පෙන්නුම් කරන අතර බොහෝ සංක්‍රමණික පක්ෂීන්ට හොද විවේක ස්ථානයක්ද වේ. පොදු උකුසු ගොයා, පුංචි මාල ඔලෙවියා, කෙන්ටි ඔලෙවියා, වී කුරුල්ලා, අළු උස්සවටුවා, මාල කොබෙයියා, මහා කොණ්ඩ මුහුදු ළිහිණියා, රැ කණා කොකා දැක ගතහැකි පක්ෂි විශේෂයන්ගෙන් කිහිපයකි.



**පොදු උකුසු ගොයා**



**පුංචි මාල ඔලෙවියා**



**මාල කොබෙයියා**

සමනල විශේෂ ලෙස අරුණු සෙව්වන්දියා, ඉරි කෝනංගියා, මලිතරිසියා සහ කූරන් විශේෂයන් ලෙස Pruinosed bloodtail බහුලව දැක ගත හැක.

කොළඹ සිට පැමිණෙන්නෙකුට කුරුණෑගල-දඹුල්ල_මැදවච්චිය-වව්නියාව-කිලිනොච්චිය-අලිමංකඩ - කයිට්ස් පාර හරහා යාපනයට ළගා වීමට හැකි අතර කොළඹ සිට මුළු දූර ප්‍රමාණය. කිලෝමීටර් 389කි. එතැන් සිට කයිට්ස් මාර්ගය හරහා කිලෝමීටර් 31ක් ගොස් කුරිකට්ටුවාන් නාවුක ජැටියට ලගා විය හැක. ජැටියේ සිට ඩෙල්ෆ් ජාතික උද්‍යානය වෙත ලගා වීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යොදා ඇති  නාවික හමුදාව විසින් පාලනය කරනු ලබන 'වඩතාරකී' සහ 'කුමුදිනී' යන විශාල බෝට්ටු දෙකක් මගින් වරකට සියයකට වඩා වැඩි පිරිසක් දූපත වෙත ප්‍රවාහනය කරනු ලබයි. උදේ 8.30ට පමණ ආරම්භ වන මෙම බෝට්ටු දෙක ද ඇතුළුව බෝට්ටු ගමන් වාර පහක් පමණ ක්‍රියාත්මක වේ. පැයක  පමණ මුහුදු ගමනකින් කිලෝමීටර් 14ක් ගමන් කල පසු ඩෙල්ෆ් දූපත වෙත ළඟා විය හැක. දූපත තුළ ප්‍රවාහනය සඳහා බස් සේවාවක් ක්‍රියාත්මක වේ. උතුරු පළාත් සභාවෙන් පවත්වාගෙන යන නවාතැන් පහසුකම් සහ සංචාරක මධ්‍යස්ථානද මෙම දූපත නැරඹීමට එන සංචාරකයින් වෙනුවෙන්  දැනට ක්‍රියාත්මක වේ.

ජල ගැලුම් වලට යට නොවන, ශාක පරිසරයට වඩා සුදුසු දූපතේ සංවර්ධිත ප්‍රදේශය මුළු ප්‍රමාණයෙන් 1/4  ක් පමණ වන අතර ඉතිරි ප්‍රදේශ සතුන් සඳහා වෙන්ව ඇත. මෙහි සම්පූර්ණ ජනගහනය 5000 කට ආසන්නය.



**නාවුක හමුදාව විසින් ක්‍රියාත්මක කරන බෝට්ටුවක්**

**ඩෙල්ෆ් ජාතික උද්‍යානය පිළිබඳව විස්තරයේ ඇති වෘක්ෂයන්ගේ නම් ලැයිස්තුව**

**டெல்ப் தேசிய பூங்கா தொடர்பான விளக்கத்தில் காணப்படும் மரங்களின் பெயர்ப் பட்டியல்**

**List of trees in the Delft National Park**

| Sinhala Names | Tamil Names | English Names | Botanical Name |
|---|---|---|---|
| තල් ශාකය | ஆசியப்பனை | Palmyra Palm | *Borassus flabellifer* |
| බයෝබැබ් | பெருக்க மரம் | Baobab / Aliyagaha | *Adonosonia digitata* |
| මල් විශේෂයන් | பூ வகைகள் | Flower Sps | |
| මල් විශේෂයන් | பூ வகைகள் | Flower Sps | |
| වැල් විශේෂයන් | கொடி வகைகள் | Creeper Sps | |
| මල් විශේෂයන් | பூ வகைகள் | Flower Sps | |
| මුහුදු ශාක විශේෂ | கடற் தாவர வகைகள் | Ocean plant Sps | |

**ඩෙල්ෆ් ජාතික උද්‍යානය පිළිබඳව විස්තරයේ ඇති සතුන්ගේ නම් ලැයිස්තුව**

**டெல்ப் தேசிய பூங்காதொடர்பான விளக்கத்தில் காணப்படும் விலங்குகளின் பெயர்ப் பட்டியல்**

**List of animals in the Delft National Park**

| Sinhala Name | Tamil Name | English Name | Scientific name |
|---|---|---|---|
| කැලෑ අශ්වයා | காட்டுக் குதிரை | Wild horse | *Equus caballus* |
| වල් හාවා | காட்டு குழி முயல் | Black naped hare | *Lepus nigricollis* |
| බොර මුගටියා | குட்டைவால் இந்திய சாம்பல் கீரிப்பிள்ளை | Brown mongoose | *Herpestes brachyurus* |
| අළු මුගටියා | சாம்பல் கீரிப்பிள்ளை | Grey mongoose | *Herpestes edwardsii* |
| මා වවුලා | பெரிய வௌவால் | Flying fox | *Pteropus giganteus* |
| ගරා කටුස්සා | பொதுவான தோட்டடப்பல்லி | Common garden lizard | *Calotes versicolor* |
| වැලි පොළඟා | சுருட்டை விரியன் | Saw- scaled viper | *Echis carinatus* |
| පොදු උකුසු ගොයා | சாதாரண சிற்றெழால் | Common kestrel | *Falco tinnunculus* |
| පුංචි මාල ඔලෙවියා | சிறிய வளையம் கொண்ட பிளவர் | Little ringed plover | *Charadrius dubius* |
| කෙන්ටි ඔලෙවියා | கென்டிஷ் ப்ளோவர் | Kentish plover | *Charadrius alexandrinus* |
| වී කුරුල්ලා | நெற்குருவி | Silver bill | *Lonchura malabarica* |
| අළු උස්සවටුවා | கௌதாரி | Grey francolin | *Francolinus pondicerianus* |
| මාල කොබෙයියා | யுரேஷியா காலர் புறா | Eurasian collared dove | *Streptopelia decaocto* |
| මහා කොණ්ඩ මුහුදු ළිහිණියා | பெரிய முகடு டெர்டன் | Great crested tern | *Sterna bergii* |
| රෑ කණ කොකා | கறுப்பு கிரீடம் அணிந்த நைட் ஹெறரான் | Black-crowned night -heron | *Nycticorax nycticorax* |
| අරුණු සෙව්වන්දියා | சிவப்புடல் அழகி | Crimoson rose butterfly | *Pachliopta hector* |
| ඉරිකි ගෝමර නීලයා | தருகஸ் நாரா | Striped pierrot butterfly | *Tarucus nara* |
| මලිතරිසියා | சிறிய சால்மன் அரபு | Small salmon arab butterfly | *Colotis amata* |
| දුරුලඹ බත්කූරන් විශේෂයන් | தும்பி இனங்கள் | Pruinosed bloodtail | *Lathrecista asiatica* |

**සංස්කාරක -** දම්මිකා මල්සිංහ, අතිරේක ලේකම් (ව්‍යාපෘති) , වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය, කෘෂිකර්ම හා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.

**උද්‍යානය පිළිබඳව විස්තර -** හසිනි සරත්චන්ද්‍ර, ප්‍රධාන මාධ්‍ය නිලධාරි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,

- මහේෂා චතුරානි පෙරේරා (අභ්‍යාසලාභී උපාධිධාරි), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**දෙමළ පරිවර්තනය -** ඒ.ආර්.එෆ්. රිෆ්නා, සංවර්ධන නිලධාරි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය, කෘෂිකර්ම හා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.

**ඉංග්‍රීසි පරිවර්තනය -** අසෝක පලිහවඩන, පරිවර්ථක, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය, කෘෂිකර්ම හා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.

**වෙබ් අඩවි සැකසුම -** එන්.අයි.ගයත්‍රි, සංවර්ධන නිලධාරි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය, කෘෂිකර්ම හා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.

- සී.ඒ.ඩී. ඩී.ඒ. කොල්ලුරේ, කළමණාකරන සේවා නිලධාරි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය, කෘෂිකර්ම හා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය.

**ඡායාරූප -** සිතියමේ ඡායාරූපය - Goonatilake, S. de A., Ekanayake, S., Kumara, T.P., Liyanapathirana, D., Weerakoon, D.K., and Wadugodapitiya, A. 2013. Sustainable Development of Delft Island: An ecological, socio economic and archaeological assessment. International Union for Conservation of Nature, Colombo, Sri Lanka & Government of Sri Lanka. viii + 86 pp

අනෙකුත් පිංතූර අන්තර්ජාලය ඇසුරෙනි.